**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය **121** - ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 24,690.17 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 21,700.51 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 2,989.66 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12.11 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 7,983.61 | 7,354.34 | 629.27 | 7.88 |
| මූලධන | 16,706.56 | 14,346.17 | 2,360.39 | 14.13 |
| එකතුව | 24,690.17 | 21,700.51 | 2,989.66 | 12.11 |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.03.07.99 සඳහා එකතුව රු.මිලියන 128 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 152 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 119 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 10.03.07.99 | 128.00 | 152.19 | 24.19 | 18.90 |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂයය අංක 12101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 30.00 | 27.06 | 1.20 | 170.36 | 350 | 288.07 |

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 7.15 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0016/0070/000 | 1.43 |
| 6000/0000/00/0001/0091/000 | 0.12 |
| 6000/0000/00/0013/0081/000 | 0.39 |
| 6000/0000/00/0002/0121/000 | 5.21 |
| | ---- |
| එකතුව | 7.15 |
| | === |

## 2.5 විගණන නිරීක්ෂණය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ආ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.45,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

**(ආ)** වැය විෂයයන් 37 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 30 ක සිට සියයට 99ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි .

**3.3** **ආදායම් ගිණුම**

**-----------------**

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 10-3-07-99 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

( අ) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 128 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 152 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 118.75 ක් වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සේවාලාභීන්ගේ අවශ්‍යතා මත නිකුත් කරනු ලබන මාසික ආදායම් සහතික, වාර්ෂික ආදායම් සහතික, වටිනාකම් සහතික හා බලපත්‍ර පිටපත් සඳහා අය කරනු ලබන ගාස්තු මගින් එකතු කරන ආදායම වැඩිවීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ආදායමක් රැස්කර ගැනීමට හැකි වී තිබුණි.

(ආ) එසේ වුවද, ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායමට වඩා සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම අඩුවීම රු.මිලියන 8 ක් වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල 10 ක් විසින් උපයන ලද ආදායම්වල අඩුවීම සියයට 9 ක සිට සියයට 93 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් පැවැතුණු අතර එම ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය අඩුවීමට බලපෑ කරුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාර අර්ධ වාර්ෂික ආදායම් වාර්තා පිළියෙල කර නොතිබුණි.

**3.4** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------------------**

විෂය අංක 12101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.32,724,365 ක්වූ අතර, එම හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 8 දෙනෙකුගෙන් ණය ශේෂ නොමැතිව රු. 62,244 ක ආපදා ණය සහ උත්සව අත්තිකාරම් ණය වාරික වශයෙන් අයකරගත් අවස්ථා නිරීක්ෂණය විය.

**(ඇ)** යාපනය දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය කාර්යාලවල ණය ශේෂ වර්ගීකරණය කර සැසඳුම් ප්‍රකාශය සමග ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 3.5.1 අභ්‍යන්තර විගණනය

-----------------------

අමාත්‍යාංශය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරක් (ශ්‍රී ලං.ග.සේ I) සහ අභ්‍යන්තර විගණක තනතුරක්ද (ශ්‍රී ලං.ග.සේ II/III ) අනුමත කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා එම තනතුරු පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන ඒකකයක්ද ස්ථාපිත කර නොතිබුණි.

### 3.5.2 විගණන හා කළමනාකරණ කමිටුව

---------------------------------------

අවම වශයෙන් කාර්තුවකට එක් වරක් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

--------------------------

වෙනත් ආයතන සතුව තිබුණු මෝටර් වාහන 13 ක් විධිමත්ව පවරා නොගෙන අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණි.

## 3.7 කාර්යයසාධනය

------------------

2015 වර්ෂයේ කාර්යයසාධන වාර්තාව අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් පිළියෙල කර තිබූ වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත අරමුණු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය දක්වා තිබුණද, එම අගයන් තහවුරු කර ගැනීමට පදනම් වන තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් එහි ප්‍රගතියේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ කාර්යසාධන වාර්තාව අනුව අභ්‍යන්තර විගණන අංශයේ අරමුණු 06 ක් ක්‍රියාත්මක කර එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය සියයට 70 ක් බව දක්වා තිබුණද, වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**-----------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 30 | 17 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 02 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 156 | 131 | 25 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 71 | 52 | 19 |
| | **එකතුව** | **263** | **202** | **61** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට හා සමාලෝචිත වර්ෂයේදී පවරා ගන්නා ලද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් 15,639 ක් සඳහා රු.7,121,055,834 ක් වැටුප් හා වේතන ගෙවා තිබුණු අතර රු.182,384,468 ක වැටුප් ණය අත්තිකාරම් ලබාදී තිබුණි. පවරා ගන්නා ලද ඉහත කාර්ය මණ්ඩලය ඇතුලුව අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.